## හැම විටම ගෞරවය හා ආශිර්වාදය ලබා ගන්නවා නම් විශ්ව ශක්තියේ පිහිටත් ලැබෙනවා.

## ඔබේ දරුවාගේ වෘත්තීය දියුණුවට අත්වැලක්

# නොසැලී ජීවත් වන පුද්ගලයන් හදන යහගුණ සහ සමාජ කුසලතා

**අද සමාජයේ පැන නැගී ඇති බොහෝ ප්‍රශ්න වලට හේතුව වී ඇත්තේ මිනිසුන් තුළ යහගුණ හා සමාජ කුසලතා නොමැති වීමයි. FCID, වංචා හා දූෂණ, මත්ද්‍රව්‍ය, රිය අනතුරු, මිනීමැරුම්, ස්ත්‍රී සහ ළමා දූෂණ, ත්‍රස්තවාදය, මෙකී සෑම ක්‍රියාවකටම මෙන්ම සමාජ අපචාර පාරේ ගමන් කරනා විට, රිය පැදවීමේ දී සහ පොදු ස්ථාන වල්දී අප දකින සමාජ අසාධාරණකම් වලට ප්‍රධාන හේතුව වී ඇත්තේ යහගුණ හා සමාජ කුසලතා නොමැති වීමයි.**

මෙය වැඩ බිමේදී ඉතා දරුණු ලෙස දක්නට ඇත. තමා කරන කාර්ය පිළිබඳව ඇති සෘණාත්මක ආකල්ප මෙන්ම, අන් අයගේ අදහස් යෝජනා නොපිළිගැනීම හා ඔවුන්ට විනීත ලෙස ගෞරව නොදැක්වීම, වගකීම් දැරීමට ඇති මැලිකම, ආත්මාර්ථකාමීත්වය, කෝපය, අත්‍යප්තිමත්භාවය ආදී නොයෙකුත් කාරණා තමා රැකියාව කරන ස්ථානයේ දියුණුවට මෙන්ම පුද්ගල දියුණුව අඩාල වීමට බලපා ඇත.

යහපාලනය සෑම තැන තිබෙනම් සාර්ථක රටවල් බිහිවේ. සාර්ථක කාර්යාල බිහිවේ. යහපත් නිවෙස් ඇතිවේ. ඒ සෑමටත් වඩා අන්‍යන්ට, නීතියට හා ක්‍රමවේදයන්ට ගරුකරන මිනිසුන් බිහිවේ. ජාතික ධනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් රටේ ජීවත්වන බාල, තරුණ, මහලු යන සියලුදෙනාගේම යහගුණ පිහිටුවීමට වියදම් කිරීමෙන් හා කාර්යයන් දියත් කිරීමෙන් ඉතා යහපත් රටේ දියුණුවට උරදෙන අනාගත පරපුරක් බිහි කිරීමෙ හැකියාව තිබේ. ජාතියක් ගොඩ නැංවීමේදී මෙවන් ධනාත්මක සිතිවිලි දරණ, ඒවා ක්‍රියාත්මක කරන පුද්ගලයන් හා ආයතන සහිත සමාජයක් බිහි කිරීම අත්‍යවශ්‍ය වේ. රටක යම්කිසි පුද්ගලයෙකු හෝ ආයතනයක් හෝ පවුලක් හෝ දියුණු වන්නේ ප්‍රතිජනනාත්මක හෝ ඉදිරිය දකින ප්‍රගතිශීලි ධනාත්මක චින්තන ඇති වුවහොත් පමණි.

### පුද්ගල සාර්ථකත්වයට උරදෙන යහගුණ හා සමාජ කුසලතා

පුද්ගල සාර්ථකත්වය අද හුදෙක් මනින්නේ මුදල් වලිනි. එම නිසා යහගුණ, පන්සිල්, ආගම පැත්තකට විසිකර මුදල් පසුපස හඹායන සමාජයක් මේ වන විට බිහිවී තිබේ. රටේ ශ්‍රම බලකායට සක්‍රීයව එකතු වියයුතු තාරුණ්‍යයක් කුඩා කල දීම අධ්‍යාපනය අතහැර මුදල් පසුපස හඹාගෙ ාස් තම තත්ත්වයට නුසුදුසු රැකියා වලට යොමු වී ඇත. මුදල් පමණක් ජීවිතය කරගත් නිසා අදවන විට කොපමණ පිරිසක් නීතියේ හස්තයට හසු වී ඇත්ද යන්න දිනපතා ප්‍රවෘත්ති බලන දකින අපට වැටහෙයි.

සැබෑ පුද්ගල සාර්ථකත්වය ඇති වන්නේ තමා ලද අධ්‍යාපනයෙන්, බුද්ධියෙන්, දැනුමෙන්, ක්‍රියාකාරීත්වයෙන් හා ගුණයෙන් සහ බලයෙන් පූර්ණ පුද්ගලයෙකු වීමෙනි. එසේ වීමෙන් නිසැකයෙන්ම ජීවිත ස්ථාරවත්වයට ළඟා වීමට හැකියාව ඇත. අද සමාජයේ ඉතා ඉහළ අධ්‍යාපනයක් ඇති මිනිසුන්, යහගුණ හා සමාජ කුසලතාවල ඇති අඩුව නිසා සමාජයෙන් කොන්වන අන්‍යන්ගේ ගැරහුමට පාත්‍රවන පුද්ගලයන් බවට පත් වී සිටයි.

සාර්ථකත්වයේ මාවතට පිවිසීමට නම් ඔබ හෝ දරුවා යහගුණ වැඩීමේ හා සමාජ කුසලතා ළඟා කර ගැනීමේ බලවත් අවශ්‍යතාව දැකිය යුතුය. එසේ දැකීමට නොහැකි වුවහොත් ඔබ හෝ දරුවා සැබෑ සාර්ථකත්වය කරා යන මානසික හා පෞරුෂ සංවර්ධනයෙන් තොර පුද්ගලයෙකු වනු ඇත. එසේම කෙනෙකු උසස් අධ්‍යාපනයක් නොලැබුව ද ඉතා හොඳ සමාජ චාරිත්‍ර, සබඳතා හා හොඳ ගුණ ප්‍රදර්ශනය කරමින් සමාජයේ කැපී පෙනෙන පුද්ගලයන් ලෙස ක්‍රියාකරන ආකාරය අප කොතෙකුත් දැක තිබේ ද?. කාර්යාලයේදී මෙවැනි පුද්ගලයන්ට ඇති පිළිගැනීම වැඩිවේ. ඔවුන්ට ඇති වගකීම් දැරීමට ඇති හැකියාව, විශ්වාසනීයත්වය, රැකියාවේ දී ඉහළ තලවලට ඔවුන් ගෙන යයි.

### සාර්ථකත්වයට යහගුණ බලපානවා ද?

**සුභාෂිතය යහගුණ ඇති පුද්ගලයා ගැන මෙලෙස දක්වා ඇත.**

තිරසර ගුණෙන් යුතු මහතකු හට පවර
සමුදුර සියල් කිරුළෙය නැඹසෙක සුනෙර
පුවතර මෙ දඹිදිව මළුවෙක සිය ගෙදර
ඔහුකර නොවන සැපතෙක් එබැවින් කවර

ස්ථිරසාර ගුණයෙන් යුක්ත වූ උත්තම මහත්මයකු හට සියලු මහ මුහුද එකම කුඩා දිය වළක් වේ. මහමෙර නැඹසෙක් වේ. මහත් වූ මේ ජම්බුද්වීපය සිය ගෙදර මිදුල වේ. එහෙයින් ඔහුගේ අතෙහි නොවන්නා වූ සම්පත්තියෙන් නම් කිමෙක් ද?



මිනී මස් කන ගෝත්‍රිකත්වයේ සිට ගෞතම බුදුන් වැනි ආගම් කතෘවරයෙකු දක්වා අප වෙනස් කරන්නේ අවබෝධය, විනය පදනම් වූ යහගුණයි. අප එකිනෙකා තුළ මෙම ගුණ අඩුවැඩි වශයෙන් පවතී. අද සාර්ථකත්වය මනින සාධක වෙනස් වී තිබේ. අද ධනය හා බලය සාර්ථකත්වය ලෙස දකී. මෙය වැරැ දි සහ තිරසාර නොවේ. මෑත අතීතයේ මෙය තිරසාර නොවන බවට ඕනෑතරම් සාධක ඇත. අද සමාජයේ තම ධනයත් බලයත් පරිහරණය කිරීමට නොහැකිව සිර ගෙවල් වල සිටින පුද්ගලයෝ ද, ඉතා බියෙන් පසුවන්නෝ ද, විකාර රූපී ක්‍රියා කරන්නෝ ද බහුලව දැකිය හැකිය.

> සැබෑ පුද්ගල සාර්ථකත්වය ඇති වන්නේ තමා ලද අධ්‍යාපනයෙන්, බුද්ධියෙන්, දැනුමෙන්, ක්‍රියාකාරිත්වයෙන් හා ගුණයෙන් සහ බලයෙන් පූර්ණ පුද්ගලයෙකු වීමෙනි. එසේ වීමෙන් නිසැකයෙන්ම ජීවිත ස්ථාවරත්වයට ළඟා වීමට හැකියාව ඇත.

එහෙත් යහපත් ලෙස ගුණ නැණ බෙලෙන් ජීවත් වන පුද්ගලයා සමාජයේ කිසිම බියක් නැතිව, අන්‍යයන්ට සෙවනක් වෙමින් නොතැවුල් සිතින් තම සාර්ථකත්වයේ අරමුණු කරා දිනෙන් දින ගමන් කරයි. මෙය පුද්ගලිකව ද, ගෙදරට ද සමාජයේද තහවුරු කළ යුතු කරුණකි.

භාෂාව හැසිරවීම, සිරිත් විරිත්, අප අඳින පලඳින හැටි, ආගමික නියැලීම, බාහිර පෙනුම, කතා විලාශය, අන්තර් පුද්ගල ක්‍රියාකාරකම්, කන බොන හැටි සියල්ල සහ තවත් දෑ යහගුණ වැඩීමට අයත්වේ. සමහරු යහගුණ ඇති බවට මවාපාන බොරු ආවරණයකින් තමා වසා ගනී. එහෙත් මෙම ආවරණය ඉතා ඉක්මනින් සමාජය අභිමුඛයේ කඩා වැටෙන බව ඔවුහු නොදනති. මවාපාන බොරු සුහදතාවය, ගුණවත්කම, ආටෝප වචන ආදිය තරම් සෙසු කිසිවක් පහත් නොවන්නේය.



**සජිත් ද සිල්වා**
**ප්‍රධාන විධායක නිලධාරි අධ්‍යක්ෂ**
PACE INSTITUTE,
**පන්නිපිටිය**

හොඳ චාරිත්‍ර, යහගුණ, පුරුදු ආත්ම විශ්වාසයෙන් ජීවිතයට ළං කර ගන්න. දවසින් දවස ඒ සඳහා උත්සාහවන්ත වන්න. ඔබ සෑම කෙනෙකුටම ප්‍රිය පුද්ගලයකු වෙනවා මෙන්ම ඇති වන නිදහස් සිත දින දින ඔබගේ අධ්‍යාපනයටත්, රැකියා දියුණුවටත්, භෞතික දියුණුවටත් යෙදිය හැකිය. විශ්ව ආශිර්වාදය ද ඔබට ලැබේ. සෑමවිටම ආශිර්වාදය හා ගෞරවය ලබාගන්නේ නම් ජීවිතය සුන්දර සහ ප්‍රගතිගාමී වෙනවා මෙන්ම, ඔවුන් අවට ඇති අයගේ ජීවිත ද සුභවාදී වේ. ඒ හරහා ඔබට ධනය නිරායාසයෙන් ම ලැබේ. එයට හේතුව වන්නේ ධනය ඉපදීමට ද දියුණුවේ යෙදීමට ද නිදහස් සිතක් අධිෂ්ඨානයක් මෙන්ම අන් අයගේ උදව් උපකාර ලැබෙන නිසාය.

ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමේ මාර්ග පිළිබඳව ඉදිරි සතිවල දී ඔබ දැනුවත් කරමු.

ඔබට මෙම කරුණු පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් පන්නිපිටියේ පිහිටි PACE INSTITUTE, අමතන්න.

දුරකථන අංක 011 5923500 - 5)

**ලක්ෂිකා මධුවන්ති රාජපක්ෂ.**